# 12 පිරුළක මිහිර

අපේ සීයා කතන්දර කීමට සමතෙකි. සීයාගේ කතන්දර ඇසීමට මා පමණක් නොව, ගෙදර අනෙක් අය ද ඉතා කැමැත්තෝ ය.

"සීයේ, සීයේ, අදත් කතන්දරයක් කියන්නකෝ." නංගී අයැද සිටියා ය.



"හා, හොඳයි. මම අද කියන්නේ උපහැරණ කතා. ඒ කියන්නේ ප්‍රස්තාව පිරුළු හැදෙන්න පදනම් වෙච්ච කතා."

"ප්‍රස්තාව පිරුළු කියන්නේ මොනවා ද සීයේ?"

"ප්‍රස්තාව පිරුළු කියන්නේ තැනට ගැළපෙන විදිහට කතාබහේ දී කියන උපමාවලට."

"එතකොට ප්‍රස්තාව පිරුළුවලින් සීයා කොහොම ද කතාවක් කියන්නේ" මල්ලී ඇසී ය.

"සමහර ප්‍රස්තාව පිරුළු හැදිලා තියෙන්නේ කුමක් හෝ කතාවක් මුල් කර ගෙන යි."

**ආඬි හත් දෙනාගේ කැඳ හැළිය වගේ** කියන ප්‍රස්තාව පිරුළ හැදුණු හැටි තමයි අද මම කියන්න යන්නේ. ඒක හරි අපූරු කතාවක්."

"ඉස්සර කාලේ ලංකාවේ 'ආඬි ගුරුන්' කියලා කට්ටියක් හිටියා. දවසක් ආඬි ගුරුන් හත් දෙනෙක් ගමනට අවශ්‍ය ජාතිත් අරගෙන දුර ගමනක් යන්න පිටත් වුණා.

මේ අය අතරමගදී අම්බලමක නතර වුණා. හැමෝම රාත්‍රි ආහාරයට කැඳ හදන්න කතිකා කර ගත්තා. එක ආඬි ගුරුන්නාන්සේ කෙනෙක් වතුර හැළියක් ළිපේ තියලා 'කැඳට අවශ්‍ය හාල් මිට ගානේ හැළියට දමමු' කියලා අනෙක් අයට යෝජනා කළා.

හැමෝම හාල් දානවා කියලා මිට මොළවා හැළියට අත දැම්මට හාල් දැම්මේ නෑ. හත් දෙනා ම එකිනෙකා රවටන්න හිතාගෙන බොරුවට අත දැම්මා.



ඊට පස්සේ කැඳ බොන්න හදන කොට උණු වතුර විතරයි හැළියේ තිබුණේ. හැම දෙනා ම රැවටුණා.

එදා ඉඳන් අනුන් රවටන්න ගිහින් තමන් රැවටුණු වේලාවට **ආඬි හත් දෙනාගේ කැඳ හැළිය වගේ** කියලා කියනවා."

"එතකොට සීයේ, **කළුවා මාරපන ගියා වගේ** කියන්නේ ඇයි?" අයියා ඇසුවේ ය.

"කළුවා මාරපන ගියා වගේ කියන්නෙත් අපූරු ප්‍රස්තාව පිරුළක් තමයි." සීයා සිනා සෙමින් කීවේ ය.

"එකෝමත් එක කාලෙක නිවසක කළුවා කියලා සේවකයෙක් හිටියා. මේ සේවකයාට දවසක් ස්වාමියා කිවුවා 'කළුවෝ මාරපන ගිහින් වරෙන්' කියලා. කළුවා ඒක ඇසුණ ගමන් මාරපන යන්න පිටත් වුණා. ස්වාමියා මාරපන යන්න අවශ්‍ය කාරණාව කියන්න බලන කොට කළුවා ගෙදර නැහැ. හවස් වෙලා කළුවා ගෙදර ආවා.



'කොහෙද කළුවෝ ගියේ?' ස්වාමියා කළුවාගෙන් ඇහැවුවා.

'ඇයි මට කිවුවා නේ මාරපන යන්න කියලා. ඒ නිසා මම මාරපන ගියා' කළුවා කිවුවා.

ස්වාමියාටත් බිරිඳටත් දෙන්නාට ම ඒකට හිනා ගියා."

"කිසි ම දෙයක් සොයන්නෙ බලන්නේ නැතිව කරන වැඩ දැක්කා ම **කළුවා මාරපන ගියා වගේ** කියලා මිනිස්සු කියනවා."

"කැකිල්ලේ රජ්ජුරුවන්ගේ නඩු තීන්දුව වගේ ප්‍රස්තාව පිරුළටත් කතාවක් තියෙනවා නේ ද, තාත්තේ?"

පැත්තකට වී සීයාගේ කතාවලට සවන් දුන් තාත්තා ඇසුවේ ය.

"කතා එකක් නොවෙයි පුතා ගොඩක් තියෙනවා. ඒවා කියනවා නම් එළිවෙනකල් කියන්න පුළුවන්." සීයා ආඩම්බරයෙන් කීවේ ය.

"කවුරු හරි මෝඩ තීරණයක් ගත්තොත් උපහැරණෙට කියන්නෙ 'කැකිල්ලෙ රජ්ජුරුවන්ගෙ නඩු තීන්දුව වගේ' කියල යි. කැකිල්ලෙ රජ්ජුරුවො එහෙම තීන්දු තීරණ ගත්ත කෙනෙක් ලු.

එක උදාහරණයක් විතරක් මං කියා දෙන්නම්.



දවසක් වරදකාරයෙක් අල්ල ගන්න රජතුමා රාජපුරුෂයෝ පිටත් කළා. 'වරදකරුවා ගෙදර නැහැ' කියලා රාජපුරුෂයෝ ඇවිත් රජතුමාට කිවුවා.

'වරදකරුවා ගෙදර නැති නම් අල්ලපු ගෙදර මිනිහව කුදලාගෙන එනු!' කියලා රජතුමා අණ කළා.

රාජපුරුෂයෝ අල්ලපු ගෙදර මිනිහා අල්ලාගෙන ආවා. ඔහුව එල්ලන්න රජතුමා අණ කළා.

ඒ මනුස්සයා බොහොම කෙට්ටු ශරීරයක් තියෙන මිනිහෙක්. ඒ නිසා එල්ලුම් ගහේ තොණ්ඩුවට අහු නො වී වැටුණා. ඒ මිනිහා කෙට්ටු වැඩි නිසා එල්ලන්නට නො හැකි බව රාජපුරුෂයෝ රජතුමාට දැන්නුවා. 'එසේ නම් ඒ වෙනුවට මහත මනුස්සයෙක් ගෙනත් එල්ලා දමනු!' කියා රජතුමා අණ කළා.

ඔය විදිහෙ මෝඩ නඩු තීන්දු තමයි කැකිල්ලෙ රජ්ජුරුවෝ අරන් තියෙන්නේ. ඒ නිසා කවුරු හරි දුරදිග නොබලා මෝඩ තීන්දුවක් ගන්න කොට **කැකිල්ලෙ රජ්ජුරුවන්ගේ නඩු තීන්දුව වගේ** කියලා කියනවා."

"එතකොට සීයේ, **ඉඟුරු දීලා මිරිස් ගත්තා වාගෙයි** කියන්නේ ඇයි?" මම සීයාගෙන් ඇසීමි.

"ඒකත් ප්‍රස්තාව පිරුළක් තමයි. ඒක පාවිච්චි වෙන්න ගත්තේ රාජසිංහ රජ්ජුරුවන්ගේ කාලෙ ඉඳලා.

රාජසිංහ රජ්ජුරුවො රට බේරා ගැනීම සඳහා පෘතුගීසීන් එක්ක දරුණු ලෙස සටන් කළා. ගන්නොරුව සටන එයින් එකක්. ඒ සටනින් රජතුමා ජය ගත්තා. ඒත් මුහුදුබඩ පළාත්වලින් පෘතුගීසීන් එළවා දාන්න රජතුමාට බැරි වුණා. රජතුමා ඒකට උපායක් යෙදුවා. ලන්දේසීන්ට පණිවිඩ යවලා ලන්දේසීන් ලවා පෘතුගීසීන් මුහුදුබඩ පළාත්වලින් එළවා දැමුවා. ඒත් ඊළඟට ලන්දේසීන් මුහුදුබඩ අල්ලා ගත්තා. පෘතුගීසීන්ට වඩා ලන්දේසීන්ගෙන් කරදර වුණා.

එක කරදරයකින් බේරෙන්න ගිහින් රජතුමාත් රටත් තවත් කරදරයක වැටුණා. '**ඉඟුරු දී මිරිස් ගත්තා වගේ** වැඩක් නේ මට වුණේ' කියලා රජතුමාට කියවුණා. එතැන් පටන් සිංහලයෝ **ඉඟුරු දී මිරිස් ගත්තා වාගේ** කියන උපහැරණේ කියන්න ගත්තා ලු."

"හරි අපූරු කතාවක් නේ!" මට කියවුණේ ඉබේට ම ය.

"කටුස්සාගේ කරේ රත්තරන් බැන්දා වගෙයි කියලා මං අහල තියෙනවා. සීයේ, ඒ කතාව මොකක් ද?"

"ඔව්, ඒ කතාව තියෙන්නේ උම්මග්ග ජාතකයේ. ඉස්සර කාලේ වේදේහ කියලා රජ කෙනෙක් හිටියා.

මේ රජතුමා මහෞෂධ පඬිතුමා එක්ක උයනට ගියා. උයනේ ඉදිරිපස තොරණ උඩ සිටි කටුස්සෙක් රජතුමා දැක බිමට බැස පසෙකින් සිටියා. රජතුමා කටුස්සා කළ දේ ගැන පඬිතුමාගෙන් ඇසුවා. රජතුමාට ගෞරව කිරීමට කටුස්සා එසේ කළ බව පඬිතුමා කිවුවා.

සතුටට පත් රජතුමා කටුස්සාට වටිනා යමක් දෙන්න යැයි කිවුවා. කටුස්සාට වටිනා වස්තුවකින් ප්‍රයෝජන නැති බවත් කෑමට යමක් දීම වඩාත් සුදුසු බවත් මහෞෂධ පඬිතුමා පැහැදිලි කළා. කටුස්සාට දිනපතා ම රත්තරන් වී ඇට දෙකහමාරක් වටිනා මස් දීමට රජතුමා සේවකයකුට නියෝග කළා.



එක පෝය දවසක කටුස්සාට දෙන්න මස් නැති වුණා. සේවකයා කටුස්සාට මස් නො දී වී ඇට දෙකහමාරක රත්තරන් කටුස්සාගේ කරේ එල්ලුවා.

එදා රජතුමා උයනට එන කොට කටුස්සා තොරණෙන් බැස්සේ නැහැ. තොරණ උඩ ඉඳගෙන ම ඔළුව වැනුවා. 'ඒ ඇයි?' කියලා රජතුමා පඬිතුමාගෙන් ඇහුවා. පඬිතුමා වෙච්ච සිද්ධිය කිවුවා.

නුසුදුසු අයට සම්මාන දුන්නා ම ඔවුන් උඩඟු වන බව මේ සිද්ධිය නිසා රජතුමා තේරුම් ගත්තා.

තමන්ට ලැබෙන දේවල්වලින් අහංකාර වෙන්නේ මෝඩ අය. ඒ වාගේ අහංකාර වෙන අය දැක්කා ම **කටුස්සාගේ කරේ රත්තරන් බැන්දා වගේ** කියලා මිනිස්සු කියනවා.”

## අවබෝධය

1. පාඩම කියවා උත්තර දෙන්න.

   i. ප්‍රස්තාව පිරුළු යනු මොනවා ද?

   ii. අතීතයේ මිනිසුන් දුර ගමන් යන අතරමග නවාතැන් ගත්තේ කොහේ ද?

   iii. ‘ඇයි මට කිවුවා නේ මාරපන යන්න කියලා. ඒ නිසා මම මාරපන ගියා’ මේ ප්‍රකාශය කළේ කවුද?

   iv. රාජසිංහ රජතුමා කරදරයකින් බේරීමට සිතා කළ දෙයින් මුහුණ පෑමට සිදු වූ අනෙක් කරදරය කුමක් ද?

   v. කටුස්සාට වටිනා වස්තුවකින් ප්‍රයෝජන නැති බව මහෞෂධ පඬිතුමා කීවේ ඇයි?

## ක්‍රියාකාරකම 1

**පහත දැක්වෙන වාක්‍යවලට ගැළපෙන පිරුළු පාඩමෙන් තෝරා ලියන්න.**

1. නුසුදුසු පුද්ගලයන්ට තනතුරු වරප්‍රසාද හිමි වීම නිසා අහංකාර වීම
2. එක කරදරයකින් නිදහස් වීමට සිතා කරන කටයුත්තකින් තවත් අපහසුතාවට පත් වීම
3. අනුන් රැවටීමට ගොස් තමා ද රැවටීමට ලක් වීම
4. කරුණු සොයා නො බලා නුසුදුසු තීරණ ගැනීම
5. විමසා බැලීමකින් තොරව කටයුතු කිරීම

## ක්‍රියාකාරකම 2

**ගුරුතුමා/ගුරුතුමියගේ මග පෙන්වීම යටතේ පන්තිය කණ්ඩායම් පහකට බෙදී පහත දැක්වෙන ක්‍රියාකාරකමේ නිරත වන්න.**

පාඩමේ සඳහන් ප්‍රස්තාව පිරුළු කණ්ඩායමට එක බැගින් බෙදා ගන්න.

තම කණ්ඩායමට ලැබුණු ප්‍රස්තාව පිරුළට අදාළ සිද්ධියක් නිර්මාණය කර ගන්න.

එය පන්තිය ඉදිරියේ රඟ දක්වා, ඊට අදාළ ප්‍රස්තාව පිරුළ විමසන්න.